අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක : 316

මගේ අංකය: ජේඑච්/එම්අයිඑස්සී/2004

ක්වාසි මණ්ඩලයේ සභාපති,
ක්වාසි මණ්ඩලයේ සාමාජිකයින් සහ
සියලුම ක්වාසිවරුන් වෙත.

## ක්වාසි තනතුර

ක්වාසි තනතුරේ ගුණාත්මක භාවය ප්‍රවර්ධනාත්මක තත්ත්වයකින් පවත්වා ගෙන යෑම කෙරෙහි සැලකිල්ලට ගත් අධිකරණ සේවා කොමිෂන් සභාව ක්වාසි මණ්ඩලයේ සභාපති, එහි සාමාජිකයින් හා සියලුම ක්වාසිවරුන් පහත සඳහන් විධිවිධාන පිළිපැදිය යුතුබවට තීරණය කරනු ලැබ ඇත.

01. **නිල ඇඳුම :** ක්වාසි මණ්ඩලයේ හා ක්වාසි අධිකරණයේ රාජකාරී කටයුතු කරන අවස්ථාවේදී විධිමත් ඇඳුම් ඇඳ සිටීම.

**විධිමත් ඇඳුම :** (i) කලිසම, සුදු කමිසය, කළු ටයිපටිය සහ කළු හෝ සුදු කබාය හෝ
(ii) ජුබ්බා, තොප්පිය සහ කළුකබාය.

02. **නිවේදනයන් නිකුත් කිරීම :** කොමිෂන් සභාවේ පූර්ව අනුමැතියකින් තොරව ගුවන් විදුලි හා රූපවාහිනී වැඩ සටහන්වලට සහභාගී වීම සහ පුවත්පත්වලට, අනිකුත් ජන මාධ්‍ය වලට නිවේදන නිකුත් කිරීමෙන් වැළකී සිටීම.

03. **වැඩමුළු හා රැස්වීම් පැවැත්වීම :** අධිකරණ සේවා කොමිෂන් සභාවේ පූර්ව අනුමැතියකින් තොරව වැඩමුළු හා රැස්වීම් පැවැත්වීමෙන් සහ එයට සහභාගී වීමෙන් වැළකී සිටීම.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ
ලේකම්

2008 ජූලි මස 24 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයයේදීය.